# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 10 ශ්‍රේණිය | ඉතිහාසය | 09 ඒකකය |
|---|---|---|

## පුනරුදය

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **වඩාත්ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. පුනරුදය මුලින්ම ආරම්භ වූයේ,

(1). ඉතාලියෙන් ය (2). එංගලන්තයෙන් ය (3). ප්‍රංශයෙන් ය (4). පෘතුගාලයෙන් ය

02. ග්‍රීක, රෝම සංස්කෘතිකවල යළි පිබිදීමක් ඇතිවීමට බලපෑ හේතුව වන්නේ,

(1). කොන්තන්තිනෝපල් නගරයේ පුස්තකාලවල පොත්පත් තැන්පත්ව තිබීම
(2). ඉතාලියේ සිටි මෙඩිසි පවුලේ අනුග්‍රහය
(3). කොන්තන්තිනෝපල් නගරය 1453 දී ඉස්ලාම් භක්තිකයන්ට යටත්වීම නිසා උගත්තු පොත්පත් රැගෙන යුරෝපා රටවලට යාම
(4). යුරෝපයේ ඇතිවූ ආගමික පුනරුදය

03. රෝම ශිෂ්ටාචාරයේ පරිහානියෙන් පසු ආගමික ආයතන මුල්කරගෙන පැවති අධ්‍යාපන ක්‍රමය තුළ ප්‍රධාන විෂයයන් වූයේ,

(1). දේව ධර්මය, ශබ්ද විද්‍යාව, දර්ශනය
(2). දර්ශනය, නීතිය, ශබ්ද විද්‍යාව,
(3). දේව ධර්මය, දර්ශනය, නීතිය
(4). පැරණි සාහිත්‍යය, නාට්‍ය, ශබ්ද විද්‍යාව

04. 1454 දී ගුටන්බර්ග් විසින් නිපදවන ලද යන්ත්‍රය වූයේ,

(1). දුවනඩාව (2). ජෙනි යන්ත්‍රය (3). වාෂ්ප එන්ජිම (4). මුද්‍රණ යන්ත්‍රය

05. පුනරුද සමයේ නැගී ආ චින්තන ප්‍රබෝධයේ ප්‍රතිඵල ලෙස කතෝලික සභාවේ දුර්වලතා විවේචනයට ලක් කළ පුද්ගලයන් පමණක් සඳහන් පිළිතුර වනුයේ,

(1). පෙට්රාක්, ජෝන් හස්, ඉරාස්මස්, ජෝන් වයික්ලිප්
(2). ජෝන් හස්, ඉරාස්මස්, පෙට්රාක්, ප්‍රැන්සිස් බේකන්
(3). ජෝන් වයික්ලිප්, ජෝන් හස්, ඉරාස්මස්, මාටින් ලූතර්
(4). ජෝන් වයික්ලිප්, ජෝන් හස්, ගැලිලියෝ ගැලිලි

06. පුනරුද සමයේ කතෝලික සභාවේ දුර්වලතා විවේචනය කළ පහත සඳහන් පුද්ගලයින් ඔවුන්ගේ මව් රට නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| | | | |
|---|---|---|---|
| (i) | ජෝන් හස් | A. | ජර්මනිය |
| (ii) | ඉරාස්මස් | B. | එංගලන්තය |
| (iii) | මාටින් ලූතර් | C. | ප්‍රංශය |
| (iv) | ජෝන් වයික්ලිප් | D. | බොහිමියාව |

(1). DCAB (2). DCBA (3). CDAB (4). CBDA

07. මධ්‍යතන යුගයේදී යුරෝපා රටවල භාවිත වූ භාෂාව වූයේ,

(1). ග්‍රීක භාෂාවයි
(2). ගෝත්‍රික භාෂාවයි
(3). ලතින් භාෂාවයි
(4). ඉංග්‍රීසි භාෂාවයි

08. යුරෝපයේ පුනරුද සමයේ සාහිත්‍යමය වශයෙන් පමණක් සේවාවක් කළ ගත්කතුවරු පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1). රෆායල්, ලූතර්, බොකෑෂියෝ
(2). ඩාන්ටේ, පෙට්රාක්, ලූතර්, වයික්ලිප්
(3). ඩාන්ටේ, පෙට්රාක්, බොකෑෂියෝ, තෝමස් මුවර්
(4). ගුටන්බර්ග්, මෙඩිසි, ඩාන්ටේ, පෙට්රාක්

09. ''ඩිවිනා කොමිඩියා'' ග්‍රන්ථය සහ ''ලෝරාට සැහැලි'' කවි නම් ග්‍රන්ථ රචනා කළ පුද්ගලයන් ගත්කතුවරු දෙදෙනා නිවැරදිව දක්වෙන පිළිතුර වන්නේ,

(1). විලියම් ෂේක්ස්පියර්, ඉරාස්මස්
(2). සර් තෝමස් මුවර්, ඉරාස්මස්
(3). ඩාන්ටේ, බොකෑෂියෝ
(4). අලගියරි ඩාන්ටේ, පෙට්රාක්

10. මානවවාදය යනු කුමක්දැයි විස්තර වන්නේ පහත සඳහන් කුමන පිළිතුරේද?

(1). මානවවාදය මත ලෝකය පවතී
(2). මානවවාදය යනු මිනිසා උතුම් කොට සැලකීමයි
(3). මානවාදය තුළින් ගැටුම් ඇතිවෙයි
(4). මිනිසාගේ පැවැත්මට මානවවාදය බාධාවකි

11. යුරෝපා ජාතීන් අතුරින් දේශ ගවේෂණයට මුලින්ම එක්වූ රටවල් දෙක වන්නේ,

(1). ඕලන්දය හා පෘතුගාලය
(2). පෘතුගාලය හා ස්පාඤ්ඤය
(3). පෘතුගාලය හා ඉතාලිය
(4). ඕලන්දය හා මහා බ්‍රිතාන්‍යය

12. පුනරුද සමයේ විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ප්‍රසිද්ධියට පත් කීපදෙනෙක් පහතින් A, B, C, D ලෙස දක්වා ඇත. ඔවුන් අතරින් සාහිත්‍යයට හා සෞඛ්‍යය ක්ෂේත්‍රයට සම්බන්ධ වූ පුද්ගලයින් දෙදෙනෙක් දක්වා ඇත්තේ කුමන පිළිතුරේද?

A - ජෝන් හස්
B - ප්‍රැන්සිස් බේකන්
C - නිකලස් කොපර්නිකස්
D - විලියම් හාවේ

(1). BD (2). BC (3). AD (4). BA

13. පහත සඳහන් (අ) හා (ආ) තීරු නිවැරදිව ගැළපූ විට පිළිතුර වන්නේ,

| (අ) | (ආ) |
|---|---|
| (i) ජොහැන්නස් ගුටෙන්බර්ග් | A. සූර්ය කේන්ද්‍රවාදය |
| (ii) පැරසල්සස් | B. ෆර්නැන්ඩෝ කෝර්ට්ස් |
| (iii) නිකලස් කොපර්නිකස් | C. ක්‍රිස්ටෝපර් කොලම්බස් |
| (iv) ජොහැන්නස් කෙප්ලර් | D. ඇමරිගෝ වෙස්පුචි |

(1). BADC (2). DABC (3). BDAC (4). DBAC

14. පුනරුද සමයේ චිත්‍ර ශිල්පියකු පමණක් නොව කවියකු, සංගීතඥයකු, විද්‍යාඥයෙක් මෙන්ම ප්‍රායෝගික ඉංජිනේරුවෙක් වශයෙන් ප්‍රසිද්ධියට පත් වූයේ,

(1). මයිකල් ආන්ජිලෝ ය
(3). රෆායල් ය
(2). ලියනාඩෝ ඩාවින්චි ය
(4). ගැලිලියෝ ගැලිලිය

15. සුදුසු පරිදි යා කර නිවැරදි පිළිතුර තෝරන්න.

(i) මෙක්සිකෝව — A. කැබේ සහෝදරයෝ
(ii) නවලෝකය — B. ෆර්නැන්ඩෝ කෝර්ටිස්
(iii) කැනඩාව — C. ක්‍රිස්ටෝපර් කොලම්බස්
(iv) බටහිර ඉන්දීය දූපත් — D. ඇමරිගෝ වෙස්පුචි

(1). BDCA (2). ACDB (3). DABC (4). BDAC

16. පෘථිවිය ගෝලාකාර බවත්, අනිකුත් ග්‍රහයන් සූර්යයා වටා පරිභ්‍රමණය වන බවත් සොයාගත්තේ,

(1). අයිසෙක් නිව්ටන් ය
(3). නිකලස් කොපර්නිකස්
(2). ගැලිලියෝ ගැලිලි ය
(4). ජොහැන්නස් කෙප්ලර් ය

17. යුරෝපීයන් ප්‍රථමයෙන් ආසියාවට පැමිණීමට සොයාගත් නව මුහුදු මාර්ග ඔස්සේ ඉන්දියාවට පැමිණියේ,

(1). ක්‍රිස්ටෝපර් කොලම්බස් ය
(3). වස්කෝදගාමා ය
(2). බර්තොලමියු ඩයස් ය
(4). ප්‍රැන්සිස්කුද අල්මේදා ය

➢ **පහත දැක්වෙන වගු ඇසුරින් 18 සහ 19 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| රට | පුද්ගලයා | සොයාගැනීම/නිපැයුම |
|---|---|---|
| A - පෝලන්තය | E - ජොහැන්නස් කෙප්ලර් | I - දුරදක්නය නිපදවීම |
| B - එංගලන්තය | F - ගැලිලියෝ ගැලිලි | J - පෘථිවිය ගෝලාකාර බව |
| C - ජර්මනිය | G - අයිසෙක් නිව්ටන් | K - ග්‍රහලෝක ඉලිප්සාකාරව ගමන් කරන බව |
| D - ඉතාලිය | H - නිලකස් කොපර්නිකස් | L - ගුරුත්වාකර්ෂණය |

18. පරිභ්‍රමණ ක්‍රියාවලිය හා සම්බන්ධ පිළිතුර වන්නේ,

(1). HAK (2). AHJ (3). AFK (4). BHI

19. ආකාශ වස්තු නිරීක්ෂණය සම්බන්ධ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1). CEI ය (2). DGI ය (3). BGL ය (4). DFI ය

20. පුනරුද සමයේ කලා ශිල්පවල සිදුවූ වෙනස්කම් සම්බන්ධ සාවද්‍ය පිළිතුර තෝරන්න.

(1). ලෞකික රසවින්දනයට මුල්තැන දීම
(2). නිර්මාණ ශ්‍රේණි වශයෙන් ඉදිරිපත් වීම
(3). ස්වභාවික දක්ෂතා ඉස්මතු වීම
(4). කර්තෘ නමින් එළිදැක්වීම

## II කොටස

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. (අ). පහත දැක්වෙන ස්ථාන ලෝක සිතියමක ලකුණු කර දක්වන්න.

කොන්ස්තන්තිනෝපල්, ඉතාලිය, ජර්මනිය, ග්‍රීසිය, පෝලන්තය, ෆ්ලෝරන්ස්, රෝමය, එංගලන්තය, ප්‍රංශය, සුභපැතීමේ තුඩුව (කුණාටු තුඩුව), කැලිකට් වරාය, පිලිපීනය, කැනඩාව, බ්‍රිතාන්‍යය, ඕලන්දය, පෘතුගාලය

02. පහත දැක්වෙන පින්තූර හොඳින් අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **සපයන්න.**



(අ). (i) මෙම චිත්‍රය දක්නට ලැබෙන්නේ කුමන දෙව්මැදුරේද?

(ii) මෙම චිත්‍රයෙන් දැක්වෙන්නේ කුමක්ද?

(iii) මෙම නිර්මාණය කළ චිත්‍ර ශිල්පියා කවුරුන්ද?



(ආ). (i) මෙම සිතුවමෙන් දැක්වෙන ආකාශ වස්තු නිරීක්ෂණය කරන විද්‍යාඥයා කවුරුන්ද?

(ii) මොහු විසින් කරන ලද නිපැයුම කුමක්ද?

(iii) මොහුව හඳුන්වනු ලබන අන්වර්ත නාමය කුමක්ද?

(iv) මොහු ආකාශ වස්තූන් නිරීක්ෂණය කිරීමෙන් සිදුකරන ලද සොයා ගැනීමක් ලියා දක්වන්න. (පෙළ පොතට අදාළ)



(ඇ). (i) මෙහි දැක්වෙන ගොඩනැගිල්ල කුමක්ද?

(ii) එය පිහිටා ඇති රට කුමක්ද?

(iii) මෙයින් නිරූපනය වන කලාත්මක ක්ෂේත්‍රය කුමක්ද?

03. (අ). යුරෝපීය පුනරුද සමයේ කලා නිර්මාණ ඉදිරිපත් කළ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ල.03)

(ආ). පුනරුදය යුරෝපයෙන් ප්‍රථමයෙන් ආරම්භ වීමට බලපෑ හේතු 4 ක් නම් කරන්න. (ල.04)

(ඇ). යුරෝපා ජාතීන්ට නව මුහුදු මාර්ග සොයා යෑමේ ගමන සාර්ථක කර ගැනීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ල.05)

(ඈ). පුනරුද සමයේ යුරෝපයේ ආර්ථික කටයුතුවල නවෝදය කරුණු 3 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.06)

04. (අ). පුනරුද සමයේ යුරෝපයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ වෙනස්කම් 3 ක් ලියන්න. (ල.03)

(ආ). මයිකල් ආන්ජිලෝ විසින් නිර්මාණය කරන ලද අග්‍රගණ්‍ය ප්‍රතිමා 2 ක් සහ ලියනාඩෝ ඩාවින්චිගේ අග්‍රගණ්‍ය නිර්මාණ 2 ක් ද නම් කරන්න. (ල.04)

(ඇ). පුනරුද සමයේ දේශපාලන හා ආර්ථික නවෝදය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල.05)

(ඈ). පුනරුදය ගෝලීය ප්‍රවණතාවයක් බවට පත්වීමත් සමඟ ලංකාවට ඇතිකළ දේශපාලන ආර්ථික හා සාමාජීය වෙනස්කම් කරුණු 3 ක් දක්වා ඒ පිළිබඳ සාකච්ඡා කරන්න. (ල.06)